# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/47 - 2015 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2015.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී./1/2012 (II).

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ණඋ), (ණඌ), සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර අමාත්‍ය.

2015 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝග 2015 ලෙස හඳුන්වනු ලැබේ.

2. කිසිදු තැනැත්තකු විසින් (මෙහි මින්මතු "යාත්‍රා" යනුවෙන් සඳහන් කරනු ලබන) දිග මීටර් 10.3 (අඩි 34) හෝ ඊට වැඩි ධීවර බෝට්ටු, මසුන් සපයන හෝ මසුන් බහාලුම් ප්‍රවාහන යාත්‍රා, reefers සහ මසුන් රැගෙන යන යාත්‍රා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ගොඩබිම ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (මෙහි මින්මතු "ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන I වන උපලේඛනයේ විස්තර සඳහන් කරනු ලබන) මගින් එම යාත්‍රා සොයා ගැනීමට හා හඳුනා ගැනීමට ඉඩ සලසන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් අනුමත කරනු ලැබූ චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය (මෙහි මින්මතු "අධීක්ෂණ උපකරණය" යනුවෙන් සඳහන් කරනු ලබන) සවිකර නොමැතිව මහ මුහුදේ ධීවර මෙහෙයුම් සඳහා යොදා නොගත යුතු ය.

3. ධීවර යාත්‍රාවේ ප්‍රධානියා, නියමුවා, හිමිකරු හෝ බලපත්‍රලාභියා විසින් බෝට්ටුවේ භූගෝලීය පිහිටුම නොකඩවා සෑම පැය 4 කට වරක් හෝ අධ්‍යක්ෂ ජනාරාල්වරයා විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන කුමන හෝ කාලසීමාවක් තුල දී ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය වෙත අවශ්‍ය තොරතුරු ස්වයංක්‍රීයව විකාශනය කිරීමට ඉඩ සලසමින් අධීක්ෂණ උපකරණය සෑම විටකදීම ක්‍රියාකාරීව ඇති බවට සහතික වීම සඳහා සියලු පියවර ගත යුත්තේ ය. මෙම දත්ත වල ඇතුලත් වනුයේ :-

(i) ධීවර යාත්‍රා හඳුනාගැනීම :

(අ) යාත්‍රා ලියාපදිංචි අංකය ;

(ආ) අන්තර්ජාතික ඇමතුම් සංඥාව ;

(ඇ) යාත්‍රාවේ නම ;

(ඈ) ජාත්‍යන්තර සමුද්‍රිය සංවිධානය (IMO) අංකය (තිබේ නම්) ;

(ඉ) ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ (IOTC) අංකය.

(ii) 99% ස්ථාවර කාල සීමාවලදී මීටර් 500 කට වඩා අඩු ස්ථානීය වරදක් ඇතිව ධීවර බෝට්ටුවේ දැනට පවත්නා භූගෝලීය පිහිටුම (අක්ෂාංශ, දේශාංශ);

(iii) ධීවර බෝට්ටුවේ ඉහත (ii) වන ඡේදයේ දක්වා ඇති (විශ්ව කාල සම්බන්ධීකරණය (UTC) මගින් දක්වා ඇති පරිදි) පිහිටුම තීරණය කිරීම සඳහා දිනය හා වේලාව;

(iv) ධීවර යාත්‍රාවේ වේගය හා දිශාව.

4. (1) දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් මහ මුහුදේ මෙහෙයුම් වල යෙදෙන යාත්‍රා වල භූගෝලීය පිහිටීම කුමක් වුවද ඒවා පිළිබඳව පැය විසිහතර පුරා අධීක්ෂණය කිරීමට වගකිව යුතු ය. මෙම ගොඩබිම පිහිටි ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය පැය හතරකට වරක් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන කුමන හෝ කාලසීමාවකට වරක් ස්වයංක්‍රීය දත්ත සැකසුම් හා ඉලෙක්ට්‍රොනික දත්ත සැපයුම් සඳහා සේවා සැපයුම්කරුවන් මගින් සම්බන්ධීකරණය කරනු ලැබූ මනා ලෙස ස්ථාපිත පරිගණක පද්ධතියක් හරහා අවශ්‍ය කරන තොරතුරු ලබා ගත යුතු ය.

(2) ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය, එම පද්ධතිය ක්‍රියාවිරහිත වීමක් සිදු වූ විටකදී ඒ වෙත ලැබුණු තොරතුරු නැවත ලබා ගැනීමේ සහ පිටපත් තබා ගැනීමේ ක්‍රියා පිළිවෙලක් පවත්වාගෙන යා යුතු ය.

5. දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ධජය යටතේ යාත්‍රා කරන ධීවර යාත්‍රා පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන කලාපීය ධීවර කළමනාකරන සංවිධානයට ලබා දිය යුතු ය.

6. ලොග් සටහන් පොතේ දත්ත තහවුරු කර ගැනීමට හා කුමන හෝ නීතිවිරෝධී, වාර්තා නොවන හා අවිධිමත් (IUU) ධීවර කටයුත්තක් හඳුනාගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ අංශය මගින් කරනු ලබන ඉල්ලීමක් අනුව ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් එම දත්ත සහ අවශ්‍ය තොරතුරු ලබා දිය යුතු ය.

7. යාත්‍රා මගින් ලබාගත් දත්ත වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා මෘදු හෝ දෘඩ පිටපත් ලෙස සටහන් තබා ගන්නා බවට සහ ආරක්ෂා කර තබා ගන්නා බවට ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) සහතික කළ යුතු ය.

8. ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින්, සේවා සැපයුම්කරුවන්ගේ සම්බන්ධීකරණය හරහා -

(i) සෑම යාත්‍රාවකම සවිකර ඇති අධීක්ෂණ උපරකණ හොඳින් ක්‍රියා කරන බවට හා හිතාමතා ඊට හානි සිදුකර නොමැති බව තහවුරු කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය ;

(ii) මහ මුහුදේ මසුන් ඇල්ලීමේ යෙදී සිටින හෝ මසුන් ඇල්ලීම ආශ්‍රිත කටයුතු වල යෙදී සිටින ධීවර යාත්‍රා සියලු අවස්ථා වලදී අධීක්ෂණය කිරීම ; සහ

(iii) දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

9. යාත්‍රාවේ ඇති අධීක්ෂණ උපකරණය දෝෂ සහිත හෝ අක්‍රීයව ඇති බව පෙනී යන්නේ නම් යාත්‍රාවේ ප්‍රධානියා, නියමුවා, හිමිකරු, බලපත්‍රලාභියා හෝ යාත්‍රාවේ ප්‍රධානියා, නියමුවා හෝ හිමිකරු විසින් බලය පවරන ලද නියෝජිතයා එම දෝෂය පිළිබඳව කඩිනමින් බලාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණය මධ්‍යස්ථානය වෙත දැන්විය යුතු අතර, සෑම පැය හතරකට වරක් හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන කාල සීමාවන් වලදී ඊ-මේල්, ෆැක්ස්, දුරකථන හෝ SSB ගුවන් විදුලි සන්නිවේදන ක්‍රම ආදී සන්නිවේදන පහසුකම් මගින් දෙපාර්තමේන්තුව සමග සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම සහ අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබාදීම සිදු කළ යුතු ය.

10. එවැනි තාක්ෂණික දෝෂයක් සිදු වූ විටක හෝ යාත්‍රාවේ සවිකර ඇති අධීක්ෂණ උපකරණය ක්‍රියා නොකරන බව සොයා ගත් විට මසක උපරිම කාලයක් ඇතුලත උපකරණය අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කළ යුතු ය. තාක්ෂණික දෝෂයකින් පසුව දෝෂය හටගත් යාත්‍රා අධීක්ෂණ පද්ධති උපරකණය අළුත්වැඩියා නොකර හා දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් සෑහීමකට පත්වන අයුරින් හොඳින් ක්‍රියාත්මක වන්නේ නම් මිස ධීවර යාත්‍රාව වරායෙන් පිටත්ව යාම නොකළ යුතු ය.

11. දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් ලිඛිතව බලය පවරනු ලබන තෙක් යාත්‍රාව වරායක ඇති විටක, එහි ඇති යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය විසන්ධි නොකළ යුතු ය. වරායාට ලගා වූ අවස්ථාවේ දී වරාය බලධාරීන්ගෙන් ලබාගත් ලිඛිත තහවුරු කිරීම සහ යාත්‍රා හිමිකරුගෙන් ලබාගත් වරායේ යාත්‍රාව නවතා තබන ලද කාලසීමාව සනාථ කෙරෙන ලිපිය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. අවසන් වරට යාත්‍රාවේ පිහිටීම සමග සැසඳූ විට යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය එබඳු තාවකාලික ක්‍රියාවිරහිත කිරීමක් සමඟ නැවත ක්‍රියාත්මක කරනු ලැබූ විට ලැබෙන පළමු ස්ථානීය වාර්තාව වෙනස් නොවිය යුතු ය.

12. යාත්‍රාවේ ප්‍රධානියා හෝ නියමුවා විසින් යාත්‍රාවේ ඇති යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය සෑම වේලාවකම ක්‍රියාත්මක තත්වයේ ඇති බවට තහවුරු කළ යුතු අතර කිසිදු තැනැත්තෙකු විසින් යාත්‍රාවේ ස්ථාපනය කර ඇති යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය විනාශ කිරීම, ඊට හානි සිදු කිරීම, එය ක්‍රියා විරහිත තත්වයට පත් කිරීම හෝ වෙනත් ආකාරයකින් ඊට මැදිහත් වීම නොකළ යුතු අතර එබඳු ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම තහනම් විය යුතු ය.

ඒවා නම්,

(අ) කුමන හෝ ආකාරයකින් යාත්‍රා අධීක්ෂණ පද්ධති (VMS) දත්ත වෙනස් කිරීම ;

(ආ) යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණයට සම්බන්ධ කර ඇති ඇන්ටනාව හෝ ඇන්ටනාවලට කුමන හෝ ආකාරයකින් බාධා කිරීම ;

(ඇ) යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණයට ලැබෙන විද්‍යුත් සැපයුම කුමන හෝ ආකාරයකින් නවතාලීම ; සහ

(ඈ) යාත්‍රා අධීක්ෂණ පද්ධති උපකරණය ධීවර යාත්‍රාවෙන් ඉවත් කිරීම හෝ දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයේ පූර්ව අනුමතියක් නොමැතිව එය යාත්‍රාවේ ස්ථාපනය කර ඇති ස්ථානය වෙනස් කිරීම.

13. පැය හතරක කාල සීමාවක් තුළදී හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන කුමන හෝ කාල සීමාවකට අනුව දෙපාර්ත්මේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය වෙත දත්ත සම්ප්‍රේෂණය සිදු නොවන විටක දී කඩිනමින් බලාත්මක වන පරිදි ඒ පිළිබඳව යාත්‍රාවේ ප්‍රධානියා හෝ හිමිකරු, බලපත්‍රලාභියා හෝ ඒ වෙනුවෙන් බලය පවරන ලද ඔවුන්ගේ නියෝජිතයකු වෙත දැනුම් දිය යුතු ය. කිසියම් යාත්‍රාවක් සම්බන්ධයෙන් එක් අවුරුදු කාලයක් තුළදී තුන් වරකට වඩා මෙසේ සිදු වන්නේ නම් එම උපකරණයට හිතාමතාම හානිකර ඇත්දැයි සොයා බැලීම සඳහා දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ප්‍රශ්නය ඇති වී ඇති උපකරණය තිල වශයෙන් පරීක්ෂා කර බැලිය යුතු ය.

14. යාත්‍රා අධීක්ෂණ පද්ධති උපරකණය හා ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය හරහා යාත්‍රාවේ ක්‍රියාකරු හෝ ප්‍රධානියා විසින් යාත්‍රාව-

(අ) විශේෂ නීති අදාල වන කුමන හෝ මුහුදු ප්‍රදේශයක මුහුදට හෝ මුහුදු සම්පත් වලට ;

(ආ) ශ්‍රී ලංකාව සාමාජිකයකු වන කලාපීය ධීවර කළමනාකරණ සංවිධානය (RFMO) මගින් නියාමනය වන ප්‍රදේශවලට ;

(ඇ) වෙනත් යම් රාජ්‍යයක අධිකරණ බල ප්‍රදේශයට අයත් ජල තීරයකට ;

(ඈ) දෙපාර්තමේන්තුව මගින් නම් කරන ලද හෝ සීමා කරන ලද වෙනත් යම් ප්‍රදේශයකට ;

ඇතුළුවන හෝ ඉන් පිටවන දිනය හා වේලාව තහවුරු කිරීම පිණිස පියවර ගනු ලැබිය යුතු ය.

15. කිසියම් සමුද්‍ර සංරක්ෂණ ප්‍රදේශයක හෝ මසුන් ඇල්ලීම සීමා කරනු ලැබූ ප්‍රදේශයක සිට සැතපුම් 20 දක්වා ආසන්න ප්‍රදේශයේ ක්‍රියාත්මක යාත්‍රා එම ප්‍රදේශයේ රැඳී සිටින පැය එකක කාල සීමාවන් තුළදී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන වෙනත් කාල සීමාවකදී ඒ පිළිබඳව වාර්තා කළ යුතු ය.

16. ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය මගින් යාත්‍රා අන්තර් හුවමාරු මෙහෙයුම් වලට අනුකූලව කටයුතු කරනු ලබන බවට සහතික කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය. හුවමාරු වන ඕනෑම යාත්‍රාවක් විසින් අනන්‍ය ආර්ථික කලාපයට ඇතුළුවන හා ඉන් පිටව යන දිනය හා වේලාව දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයට හා හුවමාරු ප්‍රදේශය අයත් වන අදාල රාජ්‍යයේ බලධාරීන්ට සන්නිවේදනය කළ යුතු ය.

17. යාත්‍රා අධීක්ෂණ දත්ත ගබඩාවට ඇති ප්‍රවේශය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා ලිඛිතව බලය පවරනු ලැබූ නිලධාරීන්ට පමණක් සීමා කළ යුතු ය. යාත්‍රා අධීක්ෂණ දත්ත ගබඩාවේ වාර්තා වලට ප්‍රවේශය ඇති සෑම කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින්ම මෙම නියෝගවල II වන උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි යාත්‍රාව පිහිටි ස්ථානය පිළිබඳ තොරතුරු භාවිත කිරීම හා අනාවරණය කිරීම සම්බන්ධයෙන් වන සීමාවන් පිළිබඳ ප්‍රකාශනයකට අත්සන් කිරීම කළ යුතු ය.

18. යාත්‍රා අධීක්ෂණය පිළිබඳව, ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය භාර නිලධාරියා වගකිව යුතු අතර එම දත්ත ආරක්ෂිතව වසා යතුරු දමා තබා ගත යුතු අතර යාත්‍රා අධීක්ෂණය කිරීමේ තොරතුරු හා දත්තවල අයිතිය දෙපාර්තමේන්තුව සතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරය යටතේ හැර එම කුමන හෝ දත්තයන් නිකුත් කරනු නොලැබිය යුතු ය.

19. යාත්‍රා අධීක්ෂණ පද්ධතිය සඳහා වන චන්ද්‍රිකා උපකරණ හෝ යම් උපකරණයක් ලබාගත හැක්කේ දෙපාර්තමේන්තුව මගින් ලිඛිතව අනුමත කරනු ලැබූ බලයලත් සේවා සැපයුම්කරුවෙකු මගින් පමණක් විය යුතු ය.

20. මෙම නියෝග සම්පූර්ණ දිග මීටර් 10.3 (අඩි 34) හෝ ඊට වැඩි ධීවර යාත්‍රා සඳහා අදාල වේ.

21. මෙම නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කළ ධීවර සහ ජලජ සම්පත් පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"මහ මුහුදේ ධීවර මෙහෙයුම්" යන්නෙන්, අනන්‍ය ආර්ථික කලාපයෙන් (නාවුක සැතපුම් 200) පිටත වූ ජල තීරයේ හෝ වෙනත් යම් රටක අධිකරණ බල සීමාවට පිටත වූ ජල තීරය තුළ සිදු කරනු ලබන ධීවර ක්‍රියාකාරකම් අදහස් වේ.

"ධීවර කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම්" යන්නෙන් මීට පෙර වරායක ගොඩබා නැති මසුන් ගොඩබෑම, ඇසුරුම් කිරීම, පිරිසැකසුම, ප්‍රතිනැව්ගත කිරීම, හෝ මසුන් ප්‍රවාහනය ඇතුළුව මසුන් ඇල්ලීම හෝ සැකසීම සඳහා සහාය වන ඕනෑම මෙහෙයුමක් මෙන්ම මුහුදේදී පුද්ගලයන්, ඉන්ධන, ධීවර ආම්පන්න හෝ වෙනත් සැපයුමක් ලබාදීම අදහස් කෙරේ.

"නීතිවිරෝධී, වාර්තා නොවන හා අවිධිමත් ධීවර කටයුතු" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14උ වගන්තියේ සඳහන් ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ 11/03 සම්මුතියේ පළමුවන ඡේදයේ දක්වා ඇති ක්‍රියාකාරකම් අදහස් වේ.

"වරාය" යන්නෙන් මසුන් ගොඩබෑම, ප්‍රතිනැව්ගත කිරීම, ඇසුරුම් කිරීම, පිරිසැකසුම, නැවත ඉන්ධන සැපයුම හෝ නැවත සැපයුම් ආදී කටයුතු සඳහා කරනු ලැබූ අක්වෙරළ පර්යන්තයන් සහ වෙනත් ස්ථාපනයන් අදහස් වේ.

"යාත්‍රාවක්" යන්නෙන් ධීවර කටයුතු සිදුකිරීමට හෝ ධීවර කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන, යොදාගනු ලැබීමට සුදානම් කරනු ලැබූ හෝ යොදා ගැනීමට අපේක්ෂිත යාත්‍රාවක්, නැවක් හෝ බෝට්ටුවක් අදහස් වේ.

(2 වන නියෝගය)

**I වන උපලේඛනය**

***ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානයේ තොරතුරු***

නම :-

ලිපිනය :-

දුරකථන අංකය :-

ටෙලෙක්ස් අංකය :-

ෆැක්ස් අංකය :-

ඊ මේල් :-

(17 වන නියෝගය)

**II** වන උපලේඛනය

*යාත්‍රා පිහිටුම් තොරතුරු භාවිතා කිරීම හා අනාවරනය වීම සීමාකිරීම පිළිබඳ ප්‍රකාශය සඳහා වන ආකෘති පත්‍රය*

ප්‍රකාශනය

පහත අත්සන් කරන ................................................................................ වන මා විසින් යාත්‍රා අධීක්ෂණ පද්ධති (VMS) මගින් මා වෙත ලබා ගත හැකි වන කුමන හෝ තොරතුරක් රහස්‍ය ලෙස තබා ගන්නා බවට හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් තැනැත්තෙකුට හැර වෙනත් යම් තැනැත්තෙකුට හෙළි කිරීමෙන් වළකින බවටත් මෙයින් සහතික වෙමි.

නිලධාරියාගේ නම -
තනතුර -
ජා. හැ. අංකය -

04 - 396/1

---

එල්.ඩී.බී/1/2012 (II).

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඕ) සහ (ත) වගන්ති යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ධීවර අමාත්‍ය.

2015 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දීය.

නියෝග

1. මෙම නියෝග 2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට නතර කිරීමට හා පිටු දැකීමට වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (මෙහි මින්මතු අධ්‍යක්ෂ ජනරාල්වරයා යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරි බලය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් විදේශීය ධීවර බෝට්ටුවකින් ශ්‍රී ලංකා ජල තීරයට පිටතදී අල්ලා ගනු ලබන මසුන් ගොඩබෑම, ප්‍රතිනැව්ගත කිරීම, ඇසුරුම් කිරීම හෝ පිරිසැකසුම් කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරා ඇති ශ්‍රී ලංකාවේ යම් වරායක දී එබඳු ධීවර බෝට්ටුවක් සඳහා නැවත ඉන්ධන සැපයීම, නැවත සේවා සැපයීම, නඩත්තු කටයුතු සිදු කිරීම, බෝට්ටුව නඩත්තු කටයුතු සඳහා වතුරෙන් ඉවතට ගැනීම වැනි සේවා ලබා නොගත යුතු ය.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් එම කටයුතු ඉන්දියන් සාගර ටූනා කොමිෂම (IOTC) මගින් පිළිගත් හා ප්‍රකාශයට පත් කරනු ලැබූ වරායක හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරා ඇති ශ්‍රී ලංකාවේ යම් වරායක හැර ශ්‍රී ලංකාවේ කිසිදු වරායකින් සිදු නොවන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය.

3. 2 වන නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද බලපත්‍රයක් සඳහා වන සෑම අයදුම්පත්‍රයක්ම මෙහි I වන උපලේඛණයේ දක්වා ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතු අතර ධජ රාජ්‍ය මගින් නිකුත් කරනු ලැබූ බෝට්ටු ලියාපදිංචි කිරීමේ සහතිකයේ. ධජ රාජ්‍යය හෝ වෙනත් වෙරළබඩ රාජ්‍යයක් මගින් නිකුත් කරනු ලැබූ මහ මුහුදේ මසුන් ඇල්ලීම සඳහා බලය පැවරීමේ සහතිකයේ සහතික කල පිටපත් හා මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති පූර්ව ප්‍රකාශය හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් ඕනෑම ලේඛනයක් රුපියල් දස දහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය.

4. මෙහි 3 වන නියෝගයේ දක්වා ඇති අයදුම්පත එම බෝට්ටුව නම් කරන ලද ධීවර වරායට පළමු වතාවට ඇතුළුවන අවස්ථාවේ දී පැය හතලිස් අටකට කලින් ද එම බෝට්ටුවේ නැවත වරක් වරායට ඇතුල්වන අවස්ථාවක දී වරායට ඇතුළුවීමට පැය විසිහතරකට කලින් හෝ ධීවර වරායට ඇති දුර ගමන් කිරීමට ගතවන කාලය පැය විසිහතරට අඩුනම් ධීවර මෙහෙයුම අවසන් වූ වහාම ද ඉදිරිපත් කළ යුතු ය.

5. (1) පිළිවෙලින් මසුන් ගොඩබෑම, ප්‍රතිනැව්ගත කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම, බෝට්ටුව නඩත්තු කටයුතු සඳහා වතුරෙන් ඉවතට ගැනීම සහ වරාය සේවා පවත්වාගෙන යාම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර III වන උපලේඛනයේ පිළිවෙලින් I වැනි කොටස, II වැනි කොටස සහ III වැනි කොටසේ දැක්වෙන ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කල යුතු ය.

(2) මෙහි 5(1) වන නියෝගයේ සඳහන් සෑම බලපත්‍රයක්ම එහි දක්වා ඇති කාල සීමාව සඳහා වලංගු විය යුතු අතර ඉන්දියන් සාගර ටූනා කොමිෂම සහ වරාය රාජ්‍යයන්වල පියවර පිළිබඳ ගිවිසුම මගින් පිළිගනු ලැබූ අදාළ යෝජනා සම්මතයන්ට අනුකූල වන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත් විය යුතු ය.

6. සෑම බලපත්‍රලාභියකුම මෙම බලපත්‍රය යටතේ කටයුතු කිරීමේ දී මෙම නියෝග මගින් හා ඒ යටතේ නිකුත් කරන ලද බලපත්‍රය මගින් පනවනු ලබන නියම හා කොන්දේසිවලට අමතරව 1948 අංක 20 දරන ආගමන හා විගමන පනතේ හා (235 වන අධිකාරිය වන) රේගු ආඥා පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු ය.

7. නම් කරන ලද වරායකට ඇතුල්වීමට බලාපොරොත්තු වන බෝට්ටුව නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතුවල (මෙහි මින්මතු IUU ධීවර කටයුතු යනුවෙන් සඳහන් කරනු ලබන) හෝ ඒ හා සම්බන්ධ කටයුතුවල හෝ ඊට ආධාර වන පරිදි ධීවර කටයුතුවල යෙදුනු බවට හෝ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන මගින් නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතුවල (IUU) හෝ ඒ හා සම්බන්ධ ධීවර කටයුතු බවට පිළිගත් ධීවර කටයුතුවල යෙදුනු බවට ලැයිස්තුවකට නම ඇතුළත් වූ බෝට්ටුවකට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට විශ්වාස කරන්නේ නම්, නම් කරන ලද වරායකට ඇතුළුවීම වැළැක්විය යුතු අතර එම වැළැක්වීමේ තීරණය, බෝට්ටුව අයත් ධජ රාජ්‍යය, මසුන් ඇල්ලීම සඳහා බලය දෙනු ලැබූ වෙරළබඩ රාජ්‍යය, බෝට්ටුවේ නියමුවා අයත් ජාතික රාජ්‍යයට හා ඉන්දියන් සාගර ටූනා කොමිෂම සභාව (IOTC) වෙත දැන්විය යුතු ය.

8. වරායට ඇතුළුවීමට අවසර දෙනු ලැබූ සෑම විදේශීය ධීවර බෝට්ටුවක්, ඒ සඳහා ලිඛිතව බලය පවරනු ලැබූ සුදුසුකම් ලත් පරීක්ෂකවරුන් විසින් IV වැනි උපලේඛනයේ දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව පරීක්ෂාකර බලා මෙහි V වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව වරාය පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. වරාය පරීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලැබූ අදාළ සම්මුතීන්ට අනුකූල වන සේ ධජ රාජ්‍යයට ද, ඉන්දියන් සාගර ටූනා කොමිෂම (IOTC) වෙත ද යොමු කළ යුතු ය.

9. පරීක්ෂා කිරීමට ලක්වන බෝට්ටුවේ නියමුවා, ක්‍රියාකරු හෝ ප්‍රධානියා විසින් බෝට්ටුව පරීක්ෂා කිරීමේ දී පරීක්ෂකවරයාට සහාය දැක්විය යුතු ය.

10. යාත්‍රාවේ යාත්‍රාවරණය සම්බන්ධයෙන් අවම මැදිහත් වීමක් හෝ අපහසුතාවක් ඇතිවීම සහ මසුන්ගේ ගුණාත්මක තත්ත්වය පහත නොවැටීම තහවුරු කිරීම පිණිස පරීක්ෂා කිරීමක් සිදු කිරීමේ දී පරීක්ෂකවරයා විසින් යම් අනිසි ප්‍රමාදයන් වලක්වනු ලැබිය යුතු ය.

11. බෝට්ටුවේ සන්නිවේදන පද්ධතිය ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ පාලන හා සෝදිසි මෙහෙයුම් අංශයේ ගුවන් විදුලි සංඛ්‍යාත හා සම්බන්ධ විය යුතු අතර සෑම බෝට්ටුවක් විසින්ම ධජ රාජ්‍යයේ යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය හා සම්බන්ධ වූ ට්‍රාන්ස්පොන්ඩර් උපකරණයක් බෝට්ටුවේ රැගෙන යා යුතු ය.

12. බෝට්ටුවේ නියමුවා, ක්‍රියාකරු හෝ ප්‍රධානියා විසින් මසුන් ඇල්ලීම පිළිබඳ දත්ත පවත්වාගෙන යනු ලබන ලොග් සටහන් පොත සහ ඇල්ලු කෙළවල්ලන් (ටූනා) සහ සමාන වර්ගයේ මත්ස්‍ය විශේෂ පිළිබඳ දත්ත එම මසුන් අල්ලනු ලැබූ භූගෝලීය පිහිටුම සමග ද මුහුදේදී ද ප්‍රතිනැව්ගත කිරීමක් සිදුවූයේ නම් ප්‍රතිනැව්ගත කිරීමේ ප්‍රකාශය ද මෙහි VI වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

13. මෙහි 2 වන නියෝගයට අනුව නිකුත් කරන ලද බලපත්‍රයේ අධිකාරී බලය යටතේ විදේශීය ධීවර බෝට්ටුවක් මගින් ගොඩබානු ලබන කෙළවල්ලන් (ටූනා) සහ ඊට සමාන වර්ගයේ මසුන්ගේ සම්පූර්ණ බරෙන් 10%ක ප්‍රමාණයක් ලංකා ධීවර සංස්ථාව සමග මිලදී ගැනීමට එකඟවන මිලකට එකී සංස්ථාවට ලබා දිය යුතු ය. ඉහත සඳහන් කෙළවල්ලන් (ටූනා) මත්ස්‍යයින්ගේ සියයට දහයක බර ප්‍රමාණය අලුත් ටූනා මසුන් 5%ක් සහ ශීත කල ටූනා මසුන් 5%කින් සමන්විත විය යුතු ය.

14. අන්තර්ජාතික නීතියට අනුව හදිසි ආපදා අවස්ථා වලදී බෝට්ටුව වරාය තුළට ඇතුළු වීම කෙරෙහි මෙම නියෝග බලා නොපෑ යුතු ය. ඒ අනුව වරාය පහසුකම් ලබා ගැනීම සඳහා, බෝට්ටුවේ ගමන් ගන්නා කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව හෝ සෞඛ්‍යය සම්බන්ධයෙන් හෝ බෝට්ටුවේ ආරක්ෂාව සම්බන්ධයෙන් අත්‍යාවශ්‍යවන්නා වූ අවශ්‍යතාවන් නියමාකාරයෙන් ඔප්පු කරන්නා වූ හෝ සුදුසු අවස්ථාවක හෝ බෝට්ටුවට අනතුරක් සිදුවීමේ ආසන්න අවදානමක් පවතින අවස්ථාවක බෝට්ටුව ඇතුළුවීම කෙරෙහි මෙම නියෝගය බලපානු නොලබයි.

15. මෙම නියෝගවල

"ධීවර කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම්" යන්නෙන් මින් පෙර වරායක ගොඩබානු නොලැබූ මසුන් ගොඩබෑම, ඇසුරුම් කිරීම, පිරිසැකසුම, ප්‍රතිනැව්ගත කිරීම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත්ව මසුන් ඇල්ලීමට ආධාර වන හෝ සූදානම් වන මෙහෙයුමක් මෙන්ම මුහුදේ දී පුද්ගලයන්, ඉන්ධන ධීවර ආම්පන්න හා වෙනත් සේවාවන් සපයාදීම අදහස් වේ ;

"නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු " යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 14උ වගන්තියේ සඳහන් ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ 11/03 සම්මුතියේ පළමුවන ඡේදයේ දක්වා ඇති ක්‍රියාකාරකම් අදහස් වේ" ;

"නම් කරන ලද වරාය" යන්නෙන් බෝට්ටුවක් ගොඩබෑම, ප්‍රතිනැව්ගත කිරීම, ඇසුරුම් කිරීම, පිරිසැකසුම, ඉන්ධන නැවත පිරවුම හෝ නැවත සේවා ලබා දීම සඳහා වන හා වරාය රාජ්‍යය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා ඉන්දියන් සාගර ටූනා කොමිෂම (IOTC) වෙත වාර්තා කරනු ලැබූ වෙරළාසන්න පර්යන්ත හා වෙනත් ස්ථාපනය කරනු ලැබූ ස්ථානයක් අදහස් වේ ;

"බෝට්ටුවක්" යන්නෙන් ධීවර කටයුතු සිදුකිරීමට හෝ ධීවර කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන, යොදාගනු ලැබීමට සූදානම් කරනු ලැබූ හෝ යොදා ගැනීමට අපේක්ෂිත යාත්‍රාවක්, නැවක් හෝ බෝට්ටුවක් අදහස් වේ.

(3 වන නියෝගය)

## I වන උපලේඛනය

***ශ්‍රී ලංකාවේ නම් කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද වරායක විදේශීය ධීවර බෝට්ටුවක් මගින් මසුන් ගොඩබෑමට/ප්‍රතිනැව්ගත කිරීමට/නඩත්තු හා වරාය සේවා ලබා ගැනීම සඳහා වන අයදුම්පත***

1. බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන දේශීය නියෝජිත/සමාගම පිළිබඳ තොරතුරු :

| | |
|---|---|
| (අ) සම්පූර්ණ නම : | (ආ) ලිපිනය : |
| (ඇ) දුරකතන අංකය : | (ඈ) ෆැක්ස් අංකය : |
| (ඉ) විද්‍යුත් තැපෑල : | (ඊ) ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අංකය : |

2. ධීවර බෝට්ටුව අයත්වන විදේශීය නියෝජිත/සමාගම පිළිබඳ තොරතුරු :

| | |
|---|---|
| (අ) සම්පූර්ණ නම : | (ආ) ලිපිනය : |
| (ඇ) දුරකතන අංකය : | (ඈ) ෆැක්ස් අංකය : |
| (ඉ) විද්‍යුත් තැපෑල : | (ඊ) ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අංකය : |

3. වරායට ඇතුළුවීමට අවශ්‍ය කෙරෙන කාරණය :

(අ) මසුන් ගොඩබෑමට ☐ (ආ) ප්‍රතිනැව්ගත කිරීමට ☐ (ඇ) නඩත්තු හා වරාය සේවා ලබාගැනීමට : ☐

4. විදේශීය බෝට්ටුව පිළිබඳ තොරතුරු :

| | |
|---|---|
| (අ) බෝට්ටුවේ නම : | (ආ) බෝට්ටුව අයත් ධජ රාජ්‍යය : |
| (ඇ) බෝට්ටුවේ ලියාපදිංචි අංකය : | (ඈ) බෝට්ටුවේ ලියාපදිංචිය වලංගු වන කාල සීමාව : |
| (ඉ) ඉන්දියන් සාගර ටූනා කොමිෂම (IOTC) බලයලත් අංකය : | (ඊ) ඉන්දියන් සාගර ටූනා කොමිෂම (IOTC) බලයදීම වලංගුවන කාල සීමාව : |

| | |
|---|---|
| (උ) මසුන් ඇල්ලීම සඳහා බලය දෙනු ලැබූ රාජ්‍යය : | (ඌ) මසුන් ඇල්ලීම සඳහා බලය දෙනු ලැබූ කාල සීමාව : |
| (එ) ගුවන්විදුලි සංඥා අංකය : | (ඒ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධාන (IMO) අංකය : |
| (ඔ) බෝට්ටුව පිටත්වූ වරාය : | (ඕ) අවසන් වරට ලඟා වූ වරාය : |

5. බෝට්ටුව පිළිබඳ විස්තරය :

| | | | |
|---|---|---|---|
| (අ) මුළු දිග | (ආ) ගිලෙන ප්‍රමාණය | (ඇ) පළල | (ඈ) කඳ සාදා ඇති ද්‍රව්‍යය |
| (ඉ) දළ බර | (ඊ) ශුද්ධ බර | (උ) ධීවර ආම්පන්න | (ඌ) ශීතාගාර පද්ධතිය |
| (එ) බෝට්ටුවේ ඇති උපකරණ | (ඒ) යාත්‍රා අධීක්ෂණ පද්ධතිය | | |

6. බෝට්ටුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු :

| නම | ජාතිය | රැකියාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| එකතුව | | |

7. ප්‍රතිනැව්ගත කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තොරතුරු :

(අ) ප්‍රතිනැව්ගත කිරීම සිදුකරනු ලබන දිනය
(ආ) මසුන් අල්ලනු ලැබූ භූගෝලීය පිහිටුම
(ඇ) රැගෙන යනු ලබන බෝට්ටුව පිළිබඳ විස්තර

| | |
|---|---|
| (අ) රැගෙන යනු ලබන බෝට්ටුවේ නම : | (ආ) බෝට්ටුව අයත් ධජ රාජ්‍යය : |
| (ඇ) යාත්‍රාවේ ලියාපදිංචි අංකය : | (ඈ) යාත්‍රාවේ ලියාපදිංචිය වලංගු වන කාල සීමාව : |
| (ඉ) ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ (IOTC) බලයලත් අංකය : | (ඊ) ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ (IOTC) බලය ලැබූ කාල සීමාව : |
| (උ) ගුවන්විදුලි සංඥා අංකය : | (ඌ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධාන (IMO) අංකය : |
| (එ) ධජ රාජ්‍යයේ බෝට්ටුව නැංගුරම්ලන දේශීය වරාය : | (ඕ) අවසන් වරට ලඟා වූ වරාය : |

(ඈ) ප්‍රතිනැව්ගත කිරීම සඳහා වන මත්ස්‍ය විශේෂ/නිෂ්පාදිතයේ වර්ගය පිළිබඳ තොරතුරු

| මත්ස්‍ය විශේෂය | නිෂ්පාදිතයේ වර්ගය (සම්පූර්ණ), අතුනුබහන් ඉවත් කරන ලද, හිස ඉවත් කරන ලද තීරු කරන ලද) | ප්‍රමාණය (ටොන්) |
|---|---|---|
| කහ වරල් කෙළවල්ලා | | |
| ඇස්ගෙඩි කෙළවල්ලා | | |
| බලයා | | |
| කොප්පරා | | |

8. නඩත්තු හා වරාය සේවා ලබාගැනීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තොරතුරු :

(අ) අවශ්‍ය කරන සේවාව :

(i) නැවත ඉන්ධන පිරවීම: ........................................................................................

(ii) නැවත සේවා සැපයීම : ජලය/අයිස්/ඇම/ආහාර/....../......./......./.......

(iii) අවශ්‍ය කෙරෙන නඩත්තු කටයුත්ත : **එන්ජිම/ප්‍රොපෙලර්/බෝට්ටුව නඩත්තු කටයුතු සඳහා වතුරෙන් ඉවතට ගැනීම.**

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි....................................................

දිනය : අත්සන

(3 වන නියෝගය)

## II වන උපලේඛනය

බෝට්ටුවක් වරායට ඇතුලු වීමේදී සැපයිය යුතු පූර්ව ප්‍රකාශය

| | |
|---|---|
| 1. පැමිණීමට අපේක්ෂිත වරාය | |
| 2. වරාය රාජ්‍යය | |
| 3. පැමිණීමට බලාපොරොත්තු වන දිනය හා වේලාව | |
| 4. අරමුණ | |
| 5. අවසන් වරට ගොඩබෑ වරාය හා දිනය | |
| 6. බෝට්ටුවේ නම | |
| 7. ධජ රාජ්‍යය | |
| 8. බෝට්ටුවේ වර්ගය | |
| 9. අන්තර්ජාතික ගුවන් විදුලි සංඥාව | |
| 10. බෝට්ටුව සම්බන්ධකර ගැනීම සම්බන්ධ තොරතුරු | |
| 11. බෝට්ටුවේ අයිතිකරු/අයිතිකරුවන් | |
| 12. ලියාපදිංචි සහතිකයේ අංකය | |
| 13. බෝට්ටුවේ අන්තර්ජාතික සමුද්‍රික සංවිධානයේ ලියාපදිංචි අංකය තිබේනම් | |
| 14. වෙනත් ලියාපදිංචියක් තිබේ නම් | |
| 15. ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ හඳුනාගැනීමේ අංකය | |

| | | | | |
|---|---|---|---|---|
| 16. යාත්‍රා සුපරීක්ෂණ පද්ධතිය | නැත | ඇත : දේශීය | ඇත, කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන | වර්ගය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17. බෝට්ටුවේ විස්තර | දිග | | පළල | | ගිලෙන ප්‍රමාණය | |

| | |
|---|---|
| 18. බෝට්ටුවේ ප්‍රධානියා හෝ නියමුවාගේ නම හා ජාතිය | |

19. ආදළ ධීවර අධිකාරිය/දෙපාර්තමේන්තුව

| පරීක්ෂා කරන නිලධරයා | නිකුත් කරනු ලැබූයේ | වලංගු කාල සීමාව | ධීවර කටයුතු සිදු කල ප්‍රදේශය | මත්ස්‍ය විශේෂ | ආම්පන්න |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

20. අදාල ප්‍රතිනැව්ගත කිරීමේ අධිකාරිය/

| | | | | | |
|---|---|---|---|---|---|
| පරීක්ෂා කරන නිලධරයා | | නිකුත් කරනු ලැබූයේ | | කාල සීමාව | |
| පරීක්ෂා කරන නිලධරයා | | නිකුත් කරනු ලැබූයේ | | කාල සීමාව | |

21. ප්‍රතිනැව්ගත කිරීම සඳහා මසුන් ලබා දෙන බෝට්ටුවේ විස්තර

| දිනය | ස්ථානය | නම | ධජ රාජ්‍යය | හැඳුනුම්පත් අංකය | මත්ස්‍ය විශේෂය | මත්ස්‍ය නිෂ්පාදනය | අල්ලනු ලැබූ ප්‍රදේශය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |

22.යාත්‍රාවේ තිබෙන මුලු මසුන් ප්‍රමාණය

23. ගොඩබෑමට නියමිත මසුන් ප්‍රමාණය

| මත්ස්‍ය විශේෂය | නිෂ්පාදන ආකාරය | අල්ලනු ලැබූ ප්‍රදේශය | ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

(5 වන නියෝගය)

## III වන උපලේඛනය

### I වන කොටස

ශ්‍රී ලංකාවේ හඳුනාගත් හා ප්‍රකාශයට පත්කරනු ලැබූ වරායකදී විදේශීය ධීවර බෝට්ටුවක් මගින් මසුන් ගොඩබෑම සඳහා බලපත්‍රය

1. ......................................හි පදිංචි ..................................ට ශ්‍රී ලංකාවට අයත් ජල තීරයෙන් පිටතදී අල්ලා ගනු ලැබූ මසුන් ................................ දරන ලියාපදිංචි අංකය හා ................................. (ධජ රාජ්‍යයේ/වෙරළාසන්න රාජ්‍යයේ ධීවර මෙහෙයුම් සඳහා බලය දෙනු ලැබූ ආයතනය) මගින් නිකුත් කරනු ලැබූ මහ මුහුදේ ධීවර මෙහෙයුම් **බලපත් අංකය**................ ............................දරණ ...................... (රට)............................. **(ධීවර බෝට්ටුවේ නම)** ධීවර බෝට්ටුව මගින් ශ්‍රී ලංකාවේ .................................. වරායේදී මසුන් ගොඩබෑම සඳහා මෙයින් බලය දෙමි.

2. මෙම බලපත්‍රය මෙහි නම් සඳහන් පුද්ගලයා විසින් පමණක් භාවිතා කළ යුතු අතර එය වෙනත් කිසිදු පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය.

3. මෙම බලපත්‍රය කලින් අවලංගු නොකරන ලද්දේ නම්, මසුන් ඇල්ලීම සඳහා වන එක් ගමන් වාරයකදී අල්ලනු ලැබූ මසුන් ගොඩබෑම සඳහා 20..............දින සිට .....................කාලයක් සඳහා වලංගු වේ.

4. මෙම බලපත්‍රයේ අධිකාරී බලය යටතේ ගොඩබාන ලද ශ්‍රී ලංකාවට අයත් ජල තීරයෙන් පිටතදී ගනු ලැබූ කුමන හෝ මත්ස්‍යයින් 2015 නීතිවිරෝධී, වාර්තා නොවූ, සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට නතර කිරීමට හා පිටු දැකීමට වරායන් තුළ රජයේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝග වල, 2 වන නියෝගය යටතේ එම කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර වරායක ඇති කුමන හෝ දේශීය හෝ විදේශීය ධීවර බෝට්ටුවක් යොදාගෙන ප්‍රතිනැව්ගත කිරීම නොකළ යුතුය.

5. මෙම බලපත්‍රය නියෝග 2015 නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට නතර කිරීමට හා පිටු දැකීමට වරායන් තුළ රජයේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝග වල, විධිවිධානවලට හා පහත දක්වා ඇති කොන්දේසි වලට යටත් විය යුතුය.

**මසුන් ගොඩබෑම සඳහා වන කොන්දේසි**

1. මෙම බලපත්‍රය **1948 අංක 20 දරන ආගමන හා විගමන පනතේ** හා රේගු ආඥා පනතේ විධිවිධානවලට යටත් විය යුතුය.

2. අල්ලනු ලැබූ මසුන් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයෙන් පිටතින් ඇල්ලිය යුතු අතර බෝට්ටුව නම් කරන ලද වරායකට ඇතුල්වීමේදී බෝට්ටුවේ ඇති ආම්පන්න ආරක්ෂිතව අසුරා තිබිය යුතු අතර ඊට ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුල මසුන් ඇල්ලීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

3. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පත්කරනු ලැබූ වරාය පරීක්ෂකවරුන්, ධීවර වරාය නීතිගත සංස්ථාවේ (CFHC) වරාය කළමණාකරුවන්, වෙරළ ආරක්ෂක හා නාවික හමුදා නිලධාරීන් සඳහා ධීවර යාත්‍රා පරීක්ෂා කිරීම සඳහා බලය ඇත.

4. බෝට්ටුවේ ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ පාලන හා සෝදිසි මෙහෙයුම් (MCS) ඒකකයේ ගුවන් විදුලි සංඛ්‍යාත සමග සම්බන්ධවී තිබිය යුතු අතර ධජ රාජ්‍යයේ කේන්ද්‍රය පිහිටුම් පද්ධතිය හා සම්බන්ධ වූ ට්‍රාන්ස්පොන්ඩර් උපකරණය යාත්‍රාවේ රැගෙන යා යුතුය.

5. මෙම බලපත්‍රය යටතේ ගොඩබානු ලබන මසුන් පිළිබඳව ගොඩබෑම අවසානයේදී මත්ස්‍ය විශේෂ අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත හා වරාය කළමනාකරුවෙකු වෙත වාර්තා කළ යුතුය.

6. බලපත්‍රය දරන්නා **ආරක්ෂක අමාත්‍යාංශය මගින්** පනවා ඇති ආරක්ෂක පියවර වලට අනුකූල විය යුතුය.

7. වරායේ මුහුදු පරිසරය වෙත කිසිම දූෂක ද්‍රව්‍යයක් මුදා නොහැරිය යුතුය.

8. බෝට්ටුව පිටවූ වරාය ධජ රාජ්‍යයක හෝ වෙරළබඩ රාජ්‍යයක පිළිගත් වරායක් විය යුතුය.

9. මුහුදු ක්ෂිරපායීන්, මුහුදු කැස්බෑවුන්, කස මෝරා විශේෂ, පොල් කොළ මෝරා සම්පූර්න මළ සිරුරු හෝ ඒවායේ යම්කිසි කොටසක් හෝ වෙනත් මෝරා විශේෂයක ශරීරයෙන් ඉවත් කරන ලද වරල් **පමණක්** ගොඩබෑම, විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

10. **ලංකා ධීවර සංස්ථාව මගින් පනවනු ලබන වෙනත් ගාස්තුවලට අමතරව** බෝට්ටුව නවතා තැබීමේ ගාස්තු හා 13 වැනි නියෝගයේ අධිකාරි බලය යටතේ විදේශීය ධීවර බෝට්ටුවක් මගින් ගොඩබානු ලබන කෙළවල්ලා **මත්ස්‍යයින්ගේ මුළු බරින් 10%ක ප්‍රමාණයක්** ලංකා ධීවර සංස්ථාව මගින් සමග **එකඟවන මිලකට** සංස්ථාවට ලබා දීමට එම **සමාගම** එකඟ විය යුතුය. ඉහත සඳහන් කරනු ලැබූ ටූනා මසුන් ප්‍රමාණය අලුත් කෙළවල්ලා මසුන් 5% ප්‍රමාණයකින් හා ශීතකල කෙළවල්ලා මසුන් 5% ප්‍රමාණයකින් යුක්තවිය යුතුය.

11. පැටවුම් බිලක් (Bill of Lading) සහිතව විදේශීය ධීවර බෝට්ටුවකින් බහාලුම්වල ඇති මසුන් වාණිජ වරායකින් ගොඩබෑමේදී මෙම කොන්දේසි අදාළ නොවේ.

II වන කොටස

ශ්‍රී ලංකාවේ නම් කරන ලද හා ප්‍රකාශයට පත් කරනු ලැබූ වරායකදී විදේශීය ධීවර යාත්‍රා මගින් ගොඩබානු ලැබූ මසුන් ප්‍රතිනැව්ගත කිරීම සඳහා වන බලපත්‍රය

1. ...........................(ලිපිනය) පදිංචි ...............................(අයදුම්කරුගේ නම) සඳහා ...........................අංක දරණ ............................(බෝට්ටුවේ නම) නමැති ................................. (රට) බෝට්ටුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ අංක ......................... (බලපත් අංකය) දරන බලපත්‍රයේ අධිකාරී බලය යටතේ ශ්‍රී ලංකාවේ ...........................වරායේ ගොඩබාන ලද කෙළවල්ලා හා කෙළවල්ලා වර්ගයට අයත් මසුන් පහත 1 වගුව මගින් දක්වා ඇති ප්‍රමාණවලින් ප්‍රතිනැව්ගත කිරීම සඳහා මෙමගින් බලය ලබා දේ.

2. මෙම බලපත්‍රය මෙහි නම් සඳහන් පුද්ගලයා විසින් පමණක් භාවිතා කළ යුතු අතර එය වෙනත් කිසිදු පුද්ගලයෙකුට නොපැවරිය යුතුය.

3. මෙම බලපත්‍රය කලින් අවලංගු නොකරන ලද්දේ නම් 20....../ ..........සිට **ආරම්භව** ................................දින දක්වා වූ .........................කාලයක් සඳහා වලංගු වේ.

4. පැටවුම් ලේඛනයක් සහිතව විදේශීය ධීවර බෝට්ටුවකින් වාණිජ වරායකදී ගොඩබානු ලබන මසුන් හා බහාලුම් මගින් අපනයනය කරන මසුන් ප්‍රතිනැව්ගත කිරීම් ලෙස සලකනු නොලැබේ.

5. මෙම බලපත්‍රය **2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට නතර කිරීමට හා පිටු දැකීමට වරායන් තුළ රාජ්‍යයේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝගවල** විධිවිධාන වලට හා පහත දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතුය.

6. 1 වගුව - ප්‍රතිනැව්ගත කිරීම අවසර ලබා දී ඇති කෙළවල්ලා හා කෙළවල්ලා වර්ගයට අයත් මසුන් පිළිබඳ විස්තර

| මත්ස්‍ය විශේෂ | ප්‍රතිනැව්ගත කිරීම සිදුකරන ආකාරය | ප්‍රමාණය කි.ග්‍රෑ/ටොන් | ප්‍රතිනැව්ගත කිරීම සිදුකරන දිනය |
|---|---|---|---|
| කහ වරල් කෙළවල්ලා | | | |
| ඇස්ගෙඩි කෙළවල්ලා | | | |
| කොප්පරා | | | |
| සප්පරා | | | |
| මෝරුන් | | | |
| වෙනත් | | | |

අධ්‍යක්ෂ ජනරාල් දිනය : ..................................................
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

III වන කොටස

ශ්‍රී ලංකාවේ නම් කරන ලද හා ප්‍රකාශයට පත් කරනු ලැබූ වරායක විදේශීය ධීවර යාත්‍රා වෙත නඩත්තු හා වරාය සේවා ලබාගැනීම සඳහා බලපත්‍රය

1. ............................නැමැති ...........................ලියාපදිංචි අංකය දරණ .................................(රට) ධීවර බෝට්ටුවට ........................දින නඩත්තු කටයුතු, නඩත්තු කටයුතු සඳහා වතුරෙන් ඉවතට ගෙන බෝට්ටු බඳ වියලීම හෝ වරාය සේවා ලබාගැනීම සඳහා පමණක් ..........වරායට ඇතුළුවීම සඳහා බලය දෙලු ලැබේ.

2. මෙම බලපත්‍රය මෙහි නම් සඳහන් පුද්ගලයා විසින් පමණක් භාවිතා කළ යුතු අතර එය වෙනත් කිසිදු පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය.

3. මෙම බලපත්‍රය එහි විශේෂයෙන් සඳහන් කරනු ලැබූ කාර්ය සඳහා පමණක් වලංගු වන අතර මෙම බලපත්‍රය යොදාගෙන වරායේදී කුමන හෝ මසුන් ගොඩබෑම් සිදු කිරීම සම්පූර්ණයෙන් තහනම් වේ.

4. මෙම බලපත්‍රය කලින් අවලංගු නොකරන ලද්දේ නම් 20...............ආරම්භ වී .....................දින දක්වා වූ ..........................කාලයක් සඳහා වලංගු වේ.

අධ්‍යක්ෂ ජනරාල් දිනය : ..................................................
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

(8 වන නියෝගය)

## IV වන උපලේඛනය

වරාය රාජ්‍යවල පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය

පරීක්ෂකවරුන් විසින්,

(අ) අවශ්‍යවන්නේ නම් ධජ රාජ්‍යය හෝ බෝට්ටුව සම්බන්ධයෙන් වන අන්තර්ජාතික වාර්තා සුදුසු පරිදි සම්බන්ධකර **ගැනීම ඇතුළුව** බෝට්ටුවේ ඇති බෝට්ටුව හඳුනාගැනීමේ ලේඛණ හා බෝට්ටුවේ හිමිකරු හා සම්බන්ධ තොරතුරු සත්‍ය, සම්පූර්ණ හා නිවැරදි බවට හැකිතාක් දුරට තහවුරු කර ගත යුතුය.

(ආ) යාත්‍රාවේ ධජය හා සලකුණු කිරීම් (උදා : නම, ලියාපදිංචි අංකය, අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය (IMO) යාත්‍රාව හඳුනා ගැනීමේ අංකය , අන්තර්ජාතික ගුවන් විදුලි සංඥා සලකුණු හා වෙනත් සලකුණු කිරීම්, දිග හා පළල) ලේඛන වල සඳහන් තොරතුරු හා අනුකූලවන බවට තහවුරු කර ගත යුතුය.

(ඇ) මසුන් ඇල්ලීමට සහ මසුන් ඇල්ලීම හා සම්බන්ධ කටයුතු සඳහා ලබාදෙනු ලැබූ අධිකාරී බලය සත්‍ය සම්පූර්ණ හා නිවැරදි බවටත් II උපලේඛනය මගින් ලබාදී ඇති තොරතුරු හා **අනුකූල** වන බවටත් හැකිතාක්දුරට තහවුරු කර **ගත යුතුය.**

(ඈ) ඉලෙක්ට්‍රොනික ආකෘති වල, යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ අඩංගු දත්ත මෙන්ම ඉන්දියන් සාගර ටූනා **කොමිෂන් සභාවේ** (IOTC) මූලස්ථානයේ හා වෙනත් අදාල කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන (RFMO) වල ඇති දත්ත ඇතුළුව බෝට්ටුවේ ඇති වෙනත් අදාළ සියලු ලේඛන හා වාර්තා සමාලෝචනය කිරීම, ලොග් සටහන් පොත (log book), ඇල්ලූ මසුන් පිළිබඳ ලේඛන, ප්‍රතිනැව්ගත කිරීම් හා වෙළඳ කටයුතු හා සම්බන්ධ ලේඛන, කාර්ය මණ්ඩලය පිළිබඳ ලැයිස්තු, ධීවර ආම්පන්න ආරක්ෂිතව තබා ගැනීම සම්බන්ධ සැලසුම් හා රූප සටහන්, ඇල්ලූ මසුන් පිළිබඳ විස්තර මෙන්ම විනාශවීමේ තර්ජනයට ලක්ව ඇති **වන සත්ව හා වෘක්ෂලතා** විශේෂ පිළිබඳ අන්තර්ජාතික වෙළඳ ගිවිසුම්වලට අනුගත වීම සඳහා අවශ්‍ය කෙරෙන ලේඛන අදාළ ලේඛනවලට ඇතුළත් වේ.

(ඉ) නොපෙනෙන ලෙසට ගබඩා කර ඇති ධීවර **ආම්පන්න හා උපකරණ ද** ඇතුළුව බෝට්ටුවේ ඇති අදාළ ධීවර ආම්පන්න හැකිතාක් දුරට පරීක්ෂා කිරීම හා ඒ සඳහා බලය ලබා දෙනු ලැබූ කොන්දේසි වලට අනුකූල වන්නේදැයි හැකිතාක් දුරට තහවුරු කර ගත යුතු අතර, ධීවර ආම්පන්නවල ඇස්වට ප්‍රමාණය. නූලේ ප්‍රමාණය, උපකරන හා ඇමුණුම්, දැල්වල හා ආම්පන්න වල දිග පළල හා පිහිටීම. කොකුවල ප්‍රමාණය හා සංඛ්‍යාව අදාළ නියෝග හා අනුකූල වන්නේ ද යන්න හා බෝට්ටුව සඳහා බලය ලබාදෙනු ලැබූ අදාළ සලකුණු වලට ගැලපෙන අයුරින් බෝට්ටුව සලකුණු කර තිබේදැයි හැකිතාක් දුරට තහවුරු කර ගත යුතුය.

(ඊ) බෝට්ටුවේ ඇති මසුන්, මසුන් ඇල්ලීම සඳහා බලය දෙනු ලැබූ ආකාරයෙන් නෙලාගෙන ඇති බවට හැකිතාක් දුරට තීරණය **කළ යුතුය.**

(උ) මසුන් නියදිගත කිරීම මගින් ඇල්ලූ මසුන්ගේ ප්‍රමාණය හා සංයුතිය පරීක්ෂා කර බැලීම එසේ පරීක්ෂා කිරීමේදී මසුන් ඇසුරුම් කර ඇති බහාලුම් විවෘත කර මසුන් ඉන් පිටතට ගෙන ඇල්ලූ මසුන්ගේ සංයුතිය **පරීක්ෂා කර බැලීම පරීක්ෂකවරුන් සිදු කළ යුතුය.** නිෂ්පාදිතයේ වර්ගය පරීක්ෂා කිරීම හා සාමාන්‍ය බර තීරණය කිරිමද මෙම පරීක්ෂා කිරීම්වලට අයත් විය හැකිය.

(ඌ) යාත්‍රාව නීතිවිරෝධි, වාර්තා නොවූ හා අවිධිමත් (IUU) ධීවර කටයුතු වල **හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වල** යෙදී ඇති බවට විශ්වාස කල හැකි ප්‍රමාණවත් සාක්ෂි ඇති දැයි **නිශ්චය කළ යුතුය.**

(එ) පරීක්ෂා කර ගතයුතු ක්‍රියාමාර්ගයද ඇතුළත් වාර්තාවක් යාත්‍රාවේ ප්‍රධානියාට ලබාදිය යුතු අතර එහි පරීක්ෂකවරයා හා යාත්‍රාවේ ප්‍රධානියා අත්සන් යොදා තිබිය යුතුය. වාර්තාවේ ඇති ප්‍රධානියාගේ අත්සන වාර්තාවේ පිටපතක් ඔහුට ලැබුණු බව සනාථ කිරීම සඳහා පමණි. වාර්තාව පිළිබඳ සිය විචාරයන් සහ විරෝධතාවන් දැක්වීම සඳහා යාත්‍රාවේ ප්‍රධානියාට අවස්ථාව ලබාදිය යුතු අතර වාර්තාවේ අන්තර්ගතය තේරුම් ගැනීමේ දැඩි දුෂ්කරතා ඇති විට එම ධජ රාජ්‍යයේ අදාළ බලධාරීන් සුදුසු පරිදි සම්බන්ධ කර ගැනීමට ඔහුට හැකිය. වාර්තාවේ පිටපතක් යාත්‍රා ප්‍රධානියා වෙත ලබාදිය යුතු ය, සහ

(ඒ) අවශ්‍ය හා හැකි හැම විටම අදාළ ලේඛණයේ පරිවර්තනයක් ලබා දීමට කටයුතු සැලැස්විය යුතුය.

(8 වන නියෝගය)

## V වන උපලේඛනය

### ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ (IOTC) වරාය සමීක්ෂණ වාර්තා ආකෘති පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සමීක්ෂණ වාර්තාවේ අංකය | | 2. වරාය රාජ්‍යය | | |
| 3. | සමීක්ෂණ අධිකාරිය | | | | |
| 4. | ප්‍රධාන පරීක්ෂකවරයාගේ නම | | හැඳුනුම්පත් අංකය | | |
| 5. | පරීක්ෂා කරනු ලැබූ වරාය | | | | |
| 6. | සමීක්ෂණය ආරම්භ කිරීම | වර්ෂය | මාසය | දිනය | පැය |
| 7. | සමීක්ෂණය නිම කිරීම | වර්ෂය | මාසය | දිනය | පැය |
| 8. | පෙර දැනුම් දීම ලැබී තිබේද යනවග | ඇත | | නැත | |
| 9. | කුමකටද යන වග | ගොඩබෑම | ප්‍රති නැව්ගත කිරීම | පිරිසැකසුම් කිරීම | වෙනත් |
| 10. | වරාය හා රාජ්‍යය හා වරායට අවසන් වරට පැමිණි දිනය | | වසර | මාසය | දිනය |
| 11. | බෝට්ටුවේ නම | | | | |
| 12. | ධජ රාජ්‍යය | | | | |
| 13. | බෝට්ටුවේ වර්ගය | | | | |
| 14. | අන්තර්ජාතික ගුවන් විදුලි ඇමතුම් සංඥාව | | | | |
| 15. | ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය | | | | |
| 16. | තිබේ නම් අන්තර්ජාතික සමුද්‍රිය සංවිධානයේ (IMO) යාත්‍රා ලියාපදිංචි කිරීමේ අංකය | | | | |
| 17. | වෙනත් ලියාපදිංචි අංකයක් තිබේ නම් | | | | |
| 18. | ලියාපදිංචි වරාය | | | | |
| 19. | බෝට්ටු හිමිකරුවන් | | | | |
| 20. | බෝට්ටුවේ හිමිකරු හැර වෙනත් ප්‍රතිලාභී හිමිකරුවන් සිටී නම් | | | | |
| 21. | බෝට්ටු හිමිකරු හැර බෝට්ටු ක්‍රියාකරු/ක්‍රියාකරුවන් සිටී නම් | | | | |
| 22. | බෝට්ටු ප්‍රධානියාගේ නම හා ජාතිය | | | | |
| 23. | මසුන් ඇල්ලීමේ ප්‍රධානියාගේ නම හා ජාතිය | | | | |
| 24. | බෝට්ටු නියෝජිත | | | | |
| 25. | යාත්‍රා අධීක්ෂණ පද්ධතිය | නැත | ඇතඃ දේශීය | ඇතඃ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන | වර්ගය |

26. ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාවේ පිළිගැනීම, නීත්‍යානුකූල, වාර්තා නොවූ, අවිධිමත් යාත්‍රා ලැයිස්තුවට ඇතුලත්ව තිබේද යන්න

| යාත්‍රාව හඳුනා ගැනීම | කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන | ධජ රාජ්‍යය තත්වය | යාත්‍රා හා බලය දෙනු ලැබූ යාත්‍රා ලැයිස්තුව | නීත්‍යානුකූල, වාර්තා නොවූ, අවිධිමත් යාත්‍රා ලැයිස්තුවට ඇතුලත් කිරීම |
|---|---|---|---|---|
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |

27. බලය දෙනු ලැබූ අදාල ධීවර කටයුතු

| හඳුනාගැනීම | නිකුත් කරනු ලැබූයේ | වලංගු භාවය | මසුන් අල්ලනු ලබන ප්‍රදේශය/ප්‍රදේශ | විශේෂ | ධීවර ආම්පන්න |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

28. අදාල ප්‍රතිනැව්ගත කිරීම සඳහා දෙනු ලැබූ බලය

| | | | | | |
|---|---|---|---|---|---|
| හඳුනාගැනීම | | නිකුත් කරනු ලැබූයේ | | වලංගුභාවය | |
| හඳුනාගැනීම | | නිකුත් කරනු ලැබූයේ | | වලංගුභාවය | |

29. ප්‍රදානය කරනු ලබන බෝට්ටුවේ ප්‍රතිනැව්ගත කිරීම සම්බන්ධ තොරතුරු

| නම | ධජ රාජ්‍යය | හඳුනාගැනීමේ අංකය | විශේෂ | නිෂ්පාදිතයේ ආකාරය | මසුන් අල්ලනු ලබන ප්‍රදේශය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

30. ගොඩබාන ලද ඇල්ලූ මසුන් ප්‍රමාණය ඇගයීම

| විශේෂය | නිෂ්පාදිතයේ ආකාරය | ඇල්ලූ ප්‍රදේශ/ප්‍රදේශය | ප්‍රකාශිත ප්‍රමාණය | ගොඩබාන ලද ප්‍රමාණය | තීරණය කරනු ලැබූ හා ප්‍රකාශ කරනු ලැබූ ප්‍රමාණය අතර වෙනසක් තිබේනම් එම ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

31. බෝට්ටුවේ තබාගනු ලැබූ ඇල්ලූ මසුන් ප්‍රමාණය

| විශේෂය | නිෂ්පාදිතයේ ආකාරය | ඇල්ලූ ප්‍රදේශ/ප්‍රදේශය | ප්‍රකාශිත ප්‍රමාණය | ගොඩබාන ලද ප්‍රමාණය | තීරණය කරනු ලැබූ හා ප්‍රකාශ කරනු ලැබූ ප්‍රමාණය අතර වෙනසක් තිබේනම් එම ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

| | | | |
|---|---|---|---|
| 32. ලොග් සටහන් පොත පරීක්ෂා කිරීම හා වෙනත් ලේඛන පරීක්ෂා කිරීම | ඇත | නැත | අදහස් |
| 33. ඇල්ලූ මසුන් ලේඛනගත කිරීමේ ක්‍රමය සමග අනුකූලතාවය | ඇත | නැත | අදහස් |
| 34. වෙළඳ තොරතුරු රැස්කිරීමේ ක්‍රමය පිළිබඳ අනුකූලතාවය | ඇත | නැත | අදහස් |
| 35. භාවිතා කරනු ලැබූ ධීවර ආම්පන්න වර්ගය | | | |
| 36. IV වන උපලේඛනය (ඉ) ඡේදය අනුව ධීවර ආම්පන්න පරීක්ෂා කිරීම කරන ලදී | ඇත | නැත | අදහස් |

37. පරීක්ෂකවරුන් විසින් සොයාගත් කරුණු

38. අදාල විධිමත් නෛතික ලේඛන වලට අදාලව දක්නට ලැබුණු උල්ලංඝනය කිරීම්

39. යාත්‍රා ප්‍රධානියාගේ අදහස් දැක්වීම

40. ගනු ලැබූ ක්‍රියාමාර්ග

41. යාත්‍රා ප්‍රධානියාගේ අත්සන

42. පරීක්ෂකවරයාගේ අත්සන

(12 වන නියෝගය)

VI වන උපලේඛනය

**ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ (IOTC) ප්‍රතිනැව්ගත කිරීමේ ප්‍රකාශය**

| රැගෙන යන යාත්‍රාව | ධීවර යාත්‍රාව |
|---|---|
| යාත්‍රාවේ නම හා ගුවන් විදුලි සංඥාව : | යාත්‍රාවේ නම හා ගුවන් විදුලි සංඥාව : |
| ධජය: | ධජය : |
| ධජ රාජ්‍ය බලපත් අංකය : | ධජ රාජ්‍ය බලපත් අංකය : |
| ජාතික ලියාපදිංචි අංකය තිබේ නම් : | ජාතික ලියාපදිංචි අංකය තිබේනම් : |
| ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ **(IOTC)** ලියාපදිංචි අංකය තිබේ නම්: | ඉන්දියන් සාගර ටූනා කොමිෂමේ **(IOTC)** ලියාපදිංචි අංකය තිබේ නම්: |

| | දිනය | මාසය | පැය | වසර | | නියෝජිතයාගේ නම: | LSTV ප්‍රධානියාගේ නම: | රැගෙන යන යාත්‍රාවේ ප්‍රධානියාගේ නම: |
|---|---|---|---|---|---|---|---|---|
| පිටත්ව යාම | | | | සිට | | | | |
| ආපසු පැමිණීම | | | | දක්වා | | අත්සන : | අත්සන : | අත්සන : |
| ප්‍රතිනැව්ගත කිරීම | | | | | | | | |

බර කිලෝග්‍රෑම් වලින් හෝ භාවිතා කරනු ලැබූ ඒකක (උදා:- පෙට්ටි, ඇසුරුම්) වලින් දක්වන්න. ගොඩබානු ලැබූ බර කිලෝග්‍රෑම් වලින් දක්වන්න ______ කිලෝ ග්‍රෑම්.

ප්‍රතිනැව්ගත කිරීම සිදුවන ස්ථානය

| මත්ස්‍ය විශේෂ | වරාය | මුහුද | නිෂ්පාදනයේ වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සම්පූර්ණ මත්ස්‍ය | අතුනුබහන් ඉවත් කරන ලද | හිස ඉවත් කරන ලද | තීරු කපන ලද | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

ප්‍රතිනැව්ගත කිරීම මුහුදේදී සිදුවූයේ නම් ඉන්දියන් සාගර ටූනා කොමිෂන් සභාවේ නිරීක්ෂකවරයාගේ නම හා අත්සන :

04-396/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.